**විසර්ජන ශීර්ෂය 127 -කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

**1 කොටස**

**කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,551,772,000ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,417,840,528 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.47,567,122 ක සිට රු.86,364,350 දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 5.5 දක්වා පරාසයක පැවතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 127 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 161,535,000 | 50,465,000 | 135,056,482 | 29,376,396 | 26,478,518 | 21,088,604 |
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව | 967,407,000 | 372,365,000 | 953,894,760 | 299,512,890 | 13,512,240 | 72,852,110 |
| | එකතුව | 1,128,942,000 | 422,830,000 | 1,088,951,242 | 328,889,286 | 39,990,758 | 93,940,714 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| 127 | 12701 | 7,000,000 | 3,753,917 | 2,000,000 | 2,533,589 | 90,000,000 | 15,273,675 |
| 221 | 22101 | 90,000,000 | 76,116,498 | 47,000,000 | 54,903,539 | 246,000,000 | 228,244,606 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් වල රු. 3,613,707 ක් වූ හර ශේෂ පැවතුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය හර |
|---|---|
| | රු. |
| කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 196,757 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 3,416,950 |
| **එකතුව** | **3,613,707** |

**(ආ) පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු. 1,820,173,563 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0040/000 | 6,642,502 |
| | 6000/0000/00/0015/0175/000 | 15,775,380 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 6000-0-0-15-102 | 1,791,496,284 |
| | 6000-0-0-3-35 | 5,948,102 |
| | 6000-0-0-6-29 | 311,295 |
| **එකතුව** | | 1,820,173,563 |

## 11 කොටස

## එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

### 1. විසර්ජන ශීර්ෂය 127 - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 සැප්තැම්බර් 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

(i) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය. |

(ii) අමාත්‍යාංශය සතු වාහන 20 කට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

වැය විෂයන් 29 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන්පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ත් සියයට 97 අතර පරාසයක තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ රු. 1,044,800 ක් වූ තැන්පතුවක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුමඅමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4)දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 1.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

අමාත්‍යාංශය විසින් 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකසා තිබූ නමුත් එය සැකසීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ), (ඈ) සහ (ඉ) ඡේදයන්හි දැක්වෙන විධිවිධාන අනුගමනය කර නොතිබූ අතර, ප්‍රසම්පාදන අත්පොතේ දැක්වෙන ආදර්ශ ආකෘතියද භාවිතා කර නොතිබුණි. එමෙන්ම 2012 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2013 අගෝස්තු 12 දින දීය.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, එම වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2013 ජුනි 10 දින දීය.

### (ආ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 3,636,740 ක් වූ අතර, එය වර්ෂයකට අඩු කාලයකට අයත් විය.

මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව මුදල් වර්ෂය තුළ ප්‍රතිපාදන සලසා ඇත්නම් පමණක් වැය බැඳීම් වලට බැඳිය යුතු වුවත් වැය විෂයයන් 07 ක් සඳහා රු.974,572 ක ප්‍රතිපාදන ඉක්මවා වැය බැඳීම් සිදුකර තිබුණු අතර වර්ෂය තුළ මේ බැරකම් ගෙවීමට සිදුවූයේ නම් එම වියදම් අතිරික්තයක් බවට පත්වන බව නිරීක්ෂණය විය.

## 1.6 කාර්යසාධනය

2012 ක්‍රියාකාරී සැලසුම හා ප්‍රගති වාර්තාවලට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකල කාර්යයන්

අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය.

- ප්‍රගති වාර්තා වලට අනුව ශ්‍රම වාසනා අරමුදලෙහි ක්‍රියාකාරකම් 05 ක් වෙනුවෙන් ඉලක්කගත මූල්‍ය අගය රුපියල් මිලියන 10.8 ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 2.55 ක් විය. මේ අනුව රුපියල් මිලියන 8.25 ක අධි ප්‍රතිපාදනයක් සලසාගෙන තිබුණි.

### (ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණය විය.

- මූල්‍ය අගයන් නොමැතිව සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම්, ප්‍රගති වාර්තාවලට ඇතුලත් වී නොමැති අවස්ථා 04 ක් නිරීක්ෂණය විය.
- ප්‍රගති වාර්තාවලට අනුව අවස්ථා 02 කදී රුපියල් මිලියන 1.68 ක් වැය කර ඇති ක්‍රියාකාරකම්, සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට පරිබාහිරව සිදුකර තිබුණි.
- සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාවල භෞතික ඉලක්කයන් අතර වෙනස්කම් අවස්ථා 03 කදී නිරීක්ෂණය විය

## 1.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 12 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතියක මට්ටම | 44 | 38 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 31 | 25 | 06 |
| | එකතුව | 93 | 79 | 14 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 14 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**2. විසර්ජන ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව**

**2.1 විගණන විෂය පථය**

කම්කරු දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 22 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වීඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිලියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**2.3 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සදහන් කරුණු නිරීකෂණය කරණු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ |
| වාහන ලොග් පොත් | මු.රෙ.1645 (අ) |

(ii) වාහන 31 කට අදාල දෛනික ධාවන සටහන් හා සාරාංශ, ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වා ගෙන යනු ලබන පොදු තැන්පත් ගිණුම් ශේෂ වල කාල විශ්ලේෂණ, ප්‍රාදේශිය කාර්යාල වල වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ආදී වූ අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට සහ ඉකුත් වර්ෂවල විගණන විමසුම් 01 කට 2013 ජූලි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 46,344,231 ක් විය.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරණු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රකාශන අලෙවියෙන් ලබාගත් රු.9,070,540 ක මුදල් රජයේ ආදායමට බැර නොකර අංක 6000-0-0-15-102 දරණ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ii) ගිණුම් අංක 6000-0-0-35 දරණ පොදු තැන්පත් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට වූ තැන්පතු ශේෂයෙහි කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරණු ලැබේ.

(i) විෂය අංක 22101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,228,011 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට 2013 ඔක්තෝබර් 11 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

(ii) චලනය නොවන හිඟ ණය ශේෂ 62 කට අදාලව රු. 1,802,850 ක හිඟ ණය ශේෂ පැවතුණි.

(iii) කේවල ශේෂ ලේඛනයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමඟ සසදා නොතිබුණි. පාලන ගිණුමේ ශේෂය රු. 232,612,735 ක් වූ අතර කේවල ශේෂ ලේඛනයේ එකතුව රු.232,610,711 ක් විය.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 2.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 2.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකසා තිබූ නමුත් එය සැකසීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ), (ඈ) සහ (ඉ) ඡේදයන්හි දැක්වෙන විධිවිධාන අනුගමනය කර නොතිබූ අතර අත්පොතේ ආදර්ශ ආකෘතියද භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.5 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අර්ථසාධක අරමුදල් හිමිකරුවන්ගේ ශේෂයන් හා අනෙකුත් විස්තර ක්ෂණිකව ලබා ගැනීම සඳහා රු.35,000 ක් වැයකර 2012 නොවැම්බර් 23 දින ගම්පහ කම්කරු කාර්යාලයට ලබා දී තිබූ කියොස්කෝ යන්ත්‍රයෙන් කිසිදු ප්‍රයෝජනයක් ලබා නොගෙන, මාස 06 ක පමණ කාලයක් කිසිදු ආරක්ෂාවක් නොමැතිව කාර්යාලය තුළ නිෂ්කාර්යව පැවති අතර, එම යන්ත්‍රය භාවිතා කිරීම පිළිබඳව උපදෙස් හෝ යන්ත්‍රය භාවිතය පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකුගේ සේවය හෝ ලබා දී නොමැති බවද නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 1647(ආ) ප්‍රකාරව වාහන ද ඒවායේ උපකරණ ද පිළිබඳ සමීක්ෂණයක් පවත්වා එම සමීක්ෂණ වාර්තා 757(2) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු වාහන 80 ක් සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 2.6 අනුකූල නොවීම්

**නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| **(i)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය සහ 1990 ඔක්තොම්බර් 11 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය. | අවිස්සාවේල්ල කම්කරු කාර්යාලයේ සංචිත වාහනය වන PB - 8834 දරණ වාහනයේ රාජ්‍ය නිල ලාංඡනය යොදා නොතිබීම සහ ඉන්ධන තුලනය කර නොතිබීම. |
| **(ii)** | **වෙනත් චක්‍රලේඛ**<br>2007 ඔක්තෝබර් 31 දිනැති අංක 15/2007 දරණ කම්කරු දෙපාරාතමේන්තු චක්‍රලේඛයේ<br>(අ) 01 ඡේදය | (i) කම්කරු නිලධාරීන් මසක් තුල අවම වශයෙන් කාලීන පරීක්ෂණ 20 ක් සිදුකල යුතු වුවත් අවිස්සාවේල්ල කම්කරු කාර්යාලයේ කාලීන පරීක්ෂණ 20 ට අඩුවෙන් සිදුකල අවස්ථා 36 ක් නිරීක්ෂණය විය.<br><br>(ii) ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරීන් විසින් මසක්තුල සිදුකල යුතු අවම පරීක්ෂණ සංඛ්‍යාව සිදු නොකල අවස්ථා 106 ක් නිරීක්ෂණය විය. |
| | (ආ) 5.01 ඡේදය | (i) ඊළඟ මාසයේ 10 වන දිනට ප්‍රථම කම්කරු නිලධාරීන් විසින් මාසික දිනපොත් සහකාර කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතු වුවද අවිස්සාවේල්ල කම්කරු කාර්යාලයේ අවස්ථා 61 කදී දිනපොත් භාරදීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර ප්‍රමාද වූ කාල පරාසය දින 02 සිට දින 52 දක්වා විය. |

(ii) ගම්පහ කම්කරු නිලධාරීන්ගේ මාසික දිනපොත් භාරදීම ප්‍රමාද වූ අවස්ථා 49 ක් නිරීක්ෂණය විය.

(ඇ) 3.1 ඡේදය

(i) අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරීන් විසින් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකල අවස්ථා 66 ක් නිරීක්ෂණය වූ අතර ඉදිරිපත් නොකිරිමට හේතු සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ගම්පහ කම්කරු කම්කරු නිලධාරීන් විසින් (2012 සහ2013මුල් මාස 03සඳහා ) පරීක්ෂණ වාර්තා කාර්යාලයට භාරදීම ප්‍රමාද වූ අවස්ථා 1943 ක් නිරීක්ෂණය විය.

## 2.7 කාර්යසාධනය

2012 ක්‍රියාකාරී සැලසුම හා ප්‍රගති වාර්තාවලට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකල කාර්යයන්

කම්කරු දෙපාර්තමේන්තුවේ 2012 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්ක වෙත සම්පූර්ණයෙන්ම ලඟා වීමට නොහැකි වූ අවස්ථා 8 ක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා වෙන් කල ප්‍රතිපාදනය රු. මි 1.172 කි. තවත් කාර්යයන් 06 ක් ඉටුකර නොගැනීම සියයට 40 සියයට 60 අතර පරාසයක වූ දුර්වල මට්ටමක පැවතුණි.

### (ආ) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ක්‍රියා කර නොතිබුණි.

(i) පසුගිය වර්ෂ 06 ක පමණ කාලපරිඡේදයක් තුල අවිස්සාවේල්ල කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරීන් විසින් පරීක්ෂා නොකල ආයතන 558 ක් නිරීක්ෂණය වූ අතර, එම ආයතනවලින් අයකර ගත යුතු සේවක අර්ථසාධක අරමුදල් හෝ සේවක පාරිතෝෂික පිලිබඳ කිසිදු තොරතුරක් ශ්‍රී ලංකා මහ බැංකුවට දන්වා යවා නොතිබුණි.

(ii) ගම්පහ කම්කරු කාර්යාලයේ 2012 වර්ෂයේදී ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්කවෙත ලඟා වීමට නොහැකි වීම් පහත පරිදි නිරීක්ෂණය විය.

**2012 වර්ෂය තුල**

| අරමුණ | ක්‍රියාකාරකම | ඉලක්කය | ඉලක්ක වෙත ලඟා නොවීම |
|---|---|---|---|
| යාවත්කාලීන කරන ලද ආයතන ලැයිසිතුව පවත්වා ගැනීම | සම්පූර්ණයෙන් නිමකිරීම | 100 ප්‍රතිශතය | නිම කිරීමට නොහැකි වී ඇත. |
| කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම | ආයතන පරීක්ෂාව | 2400 | 722 |
| පොදු සාක්ෂි ලේඛනය අනුව 2011දෙසැම්බර් 31 ට පවතින හිඟ ශේෂ අයකර ගැනීම. | සේවක අර්ථසාධක හා වෙනත් | රු. මිලියන 100 ක් | සියයට 71 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. |
| නඩු කටයුතු කාර්යක්ෂමව නිමකිරීම. | (i) 2011දෙසැම්බර් 31 දිනට පැවති විවෘත වරෙන්තු සම්බන්ධව ක්‍රියාකිරීම | 40 | සියයට 35 ක් ක්‍රියාකර නොතිබුණි. |
| | (ii)2011 පැවති අක්‍රීය නඩු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම | 226 | |

(iii) ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල බලප්‍රදේශයට අයත් සේවකයින් 100 වැඩි ආයතන 52 ක් මාස 6 සිට වර්ෂ 8 ක කාල පරාසයක් දක්වා කම්කරු නිලධාරීන්ගේ පරීක්ෂාවට භාජනය වී නොතිබූ අතර ඇතැම් ආයතන අවසන් වරට පරීක්ෂා කර තිබුනේ 2008 හා 2010 වර්ෂ වලදීය.

(iv) අවිස්සාවේල්ල කම්කරු කාර්යාලයේ 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වසර 03 ක කාලයකදී අරමුදලට දායකය, පාරිතෝෂික සහ හිඟ වැටුප් ගෙවීම් පරීක්ෂා කිරීමේදී ආයතන 60 ක් රු.26,186,411ක අදාල ගෙවීම් පැහැරහැර තිබූ අතර මෙම ආයතන වලට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි.

(v) ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ 2009 වර්ෂයේ සිට 2013 වර්ෂයේ ජනවාරි දක්වා කාල සීමාවේදී අරමුදලට දායකය, පාරිතෝෂික සහ හිඟ වැටුප් ගෙවීම් පරීක්ෂා කිරීමේදී ආයතන 47 ක් රු.5,749,246 ක අදාල ගෙවීම් පැහැර හැර තිබූ අතර මෙම ආයතන වලට ප්‍රථම නිවේදනය යවා නොතිබුණි. ආයතන 103 ක් රු.57,552,366 ක අදාල ගෙවීම් පැහැර හැර තිබූ අතර රතු නිවේදනය යැවීමට කටයුතු කර නොතිබුණි.ආයතන 159 ක් රු.83,763,822 ක අදාල ගෙවීම් පැහැර හැර තිබූ අතර මෙම ආයතන වෙත නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි.

## 2.8 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණයවූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) අධිකරණ මගින් ආයතනවලට විරුද්ධව නඩු පවරා සේවකයින්ට ගෙවිය යුතු රු.5,902,452 ක මුදල් අදාළ ආයතනවලින් අයකරගෙන ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට ප්‍රේෂණය කර තිබූ අතර, එම මුදල් අදාල හිමිකරුවන්ට ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, වසර 10 කට වඩා පැරණි ශේෂ ද මේ තුළ තිබූ අතර, මු.රෙ.571 අනුව එම කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන්ද කටයුතු කර නොතිබුණි.

(ii) ගම්පහ කම්කරු කාර්යාලයේ සංචිත වාහනය වන අංක 52 – 4396 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 1640 ආ, ඇ ජේදවලට පටහැනිව 2013 ජනවාරි - මාර්තු කාලසීමාව තුළ අවස්ථා 42 කදි කි.මී.2067 ක් සඳහා වු දෛනික දාවන සටහන් වාහනය පාවිච්චි කළ නිලධාරියා අත්සන් කර නොතිබූ අතර, ධාවන සටහනෙහි ඉන්ධන තුලනය කිරීමද සාවද්‍ය ලෙස සිදු කරන බවද නිරීක්ෂණය විය. ඉන්ධන තුලනය ලීටරයකට කි.මී 8 ක් ලෙසින් ගලපා නිවැරදි කර ඇති බව දක්වා තිබුණද තුලනයේදී වූ අතිරික්තතා හා ඌණතා ගැලපීම හා එහි වටිනාකම කොපමණද යන්න සඳහන් කර නොතිබුණි.

## 2.9 කළමනාකරණ දූර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2012 ජුලි 11 දිනැති අංක පා/11/24/01 දරන කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව කම්කරු කාර්යාලවල පැමිණීම, පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය අනිවාර්ය බව දක්වා ඇතත්, අවිස්සාවේල්ල සහ ගම්පහ කම්කරු කාර්යාලවල ඇඟිලි සලකුණු යන්ත්‍ර අක්‍රීය වී වසර දෙකකට ආසන්න කාලයක් ගතවී තිබුනද ඒවා අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) රු.1,560,619 ක් අයකර ගැනීම සඳහා ආයතන වලට පවරා තිබූ නඩු වලට විත්ති පක්ෂය නොපැමිණීම හා පදිංචිය වෙනස් කිරීම වැනි හේතූන් නිසා විවෘත වරෙන්තු නිකුත් කර තිබූ නමුත් ඒ පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ග අවිස්සාවේල්ල කම්කරු කාර්යාලය මඟින් ගෙන නොතිබූ අතර මෙසේ ක්‍රියාකර නොතිබූ කාලය අවු.03 සිට අවු. 07 දක්වා කාල පරාසයකි.

(iii) අධිකරණවල නඩු පවරා තිබූ නමුත් අක්‍රීය නඩු 45 කින් අයවිය යුතු රු. 16,980,115 ක් සම්බන්ධයෙන් ක්‍රියාකර එම මුදල් අදාල ප්‍රතිලාභීන්ට ලබා දීමට ගම්පහ දිස්ත්රික් කම්කරු කාර්යාලය මඟින් මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(iv) අරමුදලේ දායකය, සේවක පාරිතෝෂික සහ හිඟවැටුප් අයකර ගැනීමට විවිධ ආයතනවලට විරුද්ධව නඩු පවරා, විත්ති පක්ෂය නොපැමිණීම, පදිංචිය වෙනස් කිරීම වැනි හේතු නිසා විවෘත වරෙන්තු නිකුත් කර තිබූ නඩු 14 කින් අයවිය යුතු රු. 842,586 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගම්පහ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් ගෙන නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ කම්කරු දෙපාර්තමේන්තු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 205 | 136 | 69 | - |
| (ii) | තෘතියික මට්ටම | 667 | 441 | 226 | - |
| (iii) | ද්විතියක මට්ටම | 1487 | 1236 | 251 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 442 | 406 | 36 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 26 | - | 26 |
| | එකතුව | 2801 | 2245 | 582 | 26 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 582ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවකයින් 26 දෙනා පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.